
# වෛරය



නිලක්ෂි සවිද්‍යා යසස්මි

# වෛරය

නිලක්ෂි සවිදයා යසස්මි

2023/11/12

ISBN – 978-624-206-894-7

# පිදුම

*මෙම පොත් පින්ච සාර්ථකව නිම කර*
*ගැනීමට සහය ලබා දුන්*
*මගේ ආදරණීය දෙමාපියන්ටත් මගේ*
*අදරණීය සොයුරාටත් මෙවැනි දෙයක්*
*සංවිධානය කළ*
*සියලුම දෙනාට මෙම පොත පුදමි.*

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# වෛරය

ඈත එපිට සුන්දර
ගම්මානයක කුඩා නිවසක් තිබුණි. එහි ජීවත් වුණේ මව, පියා , මිත්තනිය හා දොලොස් හැවිරිදි පුතනුවන් වන අනුරාධ ය.

තම මවගේ පවුලේ තම මව පමණක් සිටි අතර පියා ගේ පවුලේ සිටි සියල්ලන් සමඟ රණ්ඩු වී අමනාප වී සිටි අනුරාධගේ මව හා පියා ට සිටියේ තම ඥාති සහෝදරයෙකු වූ අනුරාධගේ බාප්පා කෙනෙකු පමණි. දරුවන් නොසිටි නිසා අනුරාද සිටියේ තනිවම ය.

සමාජයේ පිළිබඳ යම් දැනුමක් අවශ්‍ය නිසා ඔහු සැම දිනම ගමේ පාසලට යැමට අමතක නොකළේය. එදා සෙනසුරාදා දින අලුයම අනුරාධගේ ආදරණීය මිත්තනිය මෙලොව හැර ගියා ය. මේ නිසා දැඩි ලෙස කම්පනයට පත් අනුරාධ කිසිදාක නොකෙරූ ආකාරයට සඳුදා දින

පාසලට යෑමට අදිමදි කළේය. නමුත් තම මවගේ කීම අසා ඔහු පාසල වෙත ගියේය.

නැවත නිවසට පැමිණෙන විට ගමේ සියල්ලන් අනුරාධගේ නිවස පිටුපස ඇති වැට අයිනට එක්රැස්වී සිටියේ මහා කලබලයක් ලෙසිනි. ඒ වෙත දෑස් යොමු කළ අනුරාධ සෑම තැනකම ලේ පැල්ලම් දුටුවේය. මෙය දැක බියට පත් වූ අනුරාධ ඒ වෙත යන විට අනුරාද ගේ මව අඬමින් ගේ පිල උඩ හිඳගෙන ඔළුවට අත ගසා ගන්නට විය.

මේ දැක තවත් බියට පත් වූ අනුරාදධ මව වෙත ගොස් ,"ඇයි අම්මේ අඬන්නේ ,මොකක්ද ප්‍රශ්නේ කියන්නකො" යැයි ඇසීය. එවිට ගමේ සිටි කාන්තාවන් පිරිසක් අනුරාධගේ ඔලුව අත ගෑවෝය. පසුව අනුරාධගේ මව අනුරාධ තුරුලු කරගෙන සිපගත්තාය.



ගමේ මිනිසුන් රැස්ව සිටින ස්ථානයට ගිය අනුරාධ එම දර්ශනය දුටු විට අනුරාධගේ මුළු මනසම කඩා වැටුණාක් මෙන් අනුරාධට
දැනීය .දැඩි ලෙස කම්පා වූ අනුරාද එතනම බිම හිඳගත්තා ය .ඒ සිටියේ පොලු පහර  කෑමකට ලක්වූ තම ආදරණීය පියාය. අනුරාධට තමාට දැනෙන දුක දරා ගැනීමට නොහැකි වී හයියෙන් කෑ ගසන්නට විය.

තම මිත්තණියත් තම ආදරණීය පියාත් ළඟ ළඟ ම මියයාම නිසා අනුරාධ මහත්සේ කම්පනයකට ලක් වී සිටියේය. ගමේ මිනිසුන්ගේ සහාය ඇතිව මරණාසන්නව සිටි අනුරාධගේ පියා රෝහල වෙත යොමුකර නමුත්, ඔහු රෝහල වෙත ගෙන යන විටත් මිය ගොස් සිටියේ ය. ඊට පසුදින අවමංගලය  උත්සවය පැවැතුණේය.

ඉන් දින කිහිපයකට පසු ගෙයි පිල උඩට වී අනුරාධ මද වේලාවක් කල්පනා කර සිටියේ, තම මෑණියනුත් මේ ආකාරයෙන්ම මියගියහොත් තමන්ට අත්වන ඉරණම පිළිබඳවත්, පියාණන් නැති නිසා පාසල් කටයුතු අත්හැර කිසියම් හෝ රස්සාවක් වෙත යෑමටත් ඔහු තීරණය කළේය. මෙම ස්ථානයට අනුරාධගේ මවද පැමිණි අතර



තම අදහස අනුරාද තම මෑණියන්ට පැවසුවේය. නමුත් මෑණියන් එම අදහසට කිසිසේත්ම එකඟ නොවුණා ය.

තමා කුඩා දරුවෙකු බවත් හොඳින් ඉගෙනගෙන රස්සාවක් කරන බවත් ඔහුට කියා දුන්නා ය.

ඒ අතරම අනුරාධ තම මව ගෙන් මෙසේ ඇසීය. "අම්මේ, ඇයි තාත්තා නැතිවුණේ. අම්මා තාම මට ඒ ගැන කිව්වෙ නෑ. තාත්තට කවුද ගැහුවෙ" මෙය අසනවිට අනුරාධගේ මව ගේ දෑස කඳුළින් තෙත් විය. අනුරාධ සිප ගත් ඇය වෙනත් මාතෘකාවක් වෙත යොමුවිය. "තාත්තා නැති වුණ එක ගැන පුතාට පස්සෙ දැනගන්න පුළුවන් දැන් යන්න ගිහින් වැඩක් කරගන්න"
බව පැවසුවාය.

- 

මාසයකට පසු •

එදා සඳුදා දවසකි. අම්මා උදෑසනම නැගිට කලබලෙන් ආහාර පිසීය. මේ දුටු අනුරාධ එතැනට පැමිණ "ඇයි අම්මේ මේ, අද කොහේ හරි යනවද? ඔව් පුතා අද නඩුව බලන්න යන්න ඕනේ. ඉක්මනට පුතාත් මූණ

හෝදගෙන ඇවිල්ල ලෑස්ති වෙන්න." මොන නඩුව ද අම්මේ. ප්‍රශ්න අහන්නෙ නැතුව කිව්ව දේ විතරක් කරන්න මව කීවාය.

දෙදෙනාම ලෑස්ති වී නිවසෙන් පිටත්ව ගමේ බස්රථයෙන් නගරය වෙත ගියෝය.යන අතරතුරදී අනුරාධගේ ප්‍රශ්න රාශියකට මූණ දීමට මවට සිදුවිය. "නඩුව කියන්නේ මොකක්ද අම්මේ"... වැනි ප්‍රශ්න රාශියක් අනුරාධ ඇසීය.

නඩුව ආරම්භ විය. නමුත් මේ කිසිවක් පිළිබඳව අනුරාධ දැන සිටියේ නැත. කෙටියෙන් පැවසුවහොත් අනුරාධ නඩුව යන්නේ කුමක්දැයි වත් දැන සිටියේ නැත. නමුත් නොයෙක් අය කතා කළා ආකාරයෙන් මෙය මෙම නඩුව පියාණන්ගේ මරණය සම්බන්ධව බව අනුරාධ දැනගත්තේය .

මේ අතර අනුරාධ නැවත තම මවට ප්‍රශ්නයක් අමු කළේය. "අම්මෙ අර අපේ ගෙදර එහාපැත්තෙ ඉන්න අපේ තාත්තගේ සහෝදරයෙකු වන අර බාප්පා නේද? ඇයි එයා මෙතන ඉන්නේ..." ඉන්නේ ද.. තව චුට්ටකින් පුතාට ඒක හොඳින් පැහැදිලි වෙයි. පොඩ්ඩක් ඉන්න.

පැය 4කින් පසු අනුරාධට මේ සියල්ල හොඳින් පැහැදිලි විය. තම මිත්තණිය විසින් බෙදන ලද ඉඩමකට රණ්ඩුසරුවල් වී තම බාප්පා විසින් තම පියාණන් ව ඝාතනය කර ඇත. මෙම කතා පුවත අසනවිට අනුරාධගේ නෙත කඳුළින් තෙත් විය. මැණියන් මෙම සිද්ධියට සාධාරණයක් ඉෂ්ට කරන ලෙස දන්වා සිටියාය."මේ නැතිවුනේ පුංචි කොලු පැටියෙකුට රටක් වගේ වටින තාත්තා කෙනෙක්..."

ඔවුන්ට සාධාරණයක් ඉටු විය. අනුරාධ සහ අනුරාධගේ මව නැවත නිවසට පැමිණ සවස් යාමයේදී සතුටින් විවේක සුවයෙන් ගේ පිලට වී කතාබ ක යෙදුණේය. ඇයි අම්මෙ මේ ඉඩමකට රණ්ඩු වුනේ. දැන් බලන්න වෙච්ච දේ මේ ඉඩම තාත්තටත් නෑ බාප්පාටත් නෑ . දැන් ඒක අයිති රජයට. අපි අය කවදාවත් ඒ වගේ දේකට රණ්ඩු නොවී ඉමු. මේ වගේ දේවල් වලින් අසරණ මිනිසුන්ගේ ජීවිත පවා නැති වෙන්න පුළුවන්... "ඔව් පුතේ ඒක ඇත්ත" එම කතාවට එකඟ විය .පසුව අනුරාධගේ මව අනුරාධ සිපගෙන දෙදෙනාම නිවස තුළට ගියෝය.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා ප්‍රංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20